# කාර්ය පත්‍රිකාව

**තේමාව** - ජලය

**විෂය** - පෙරදිග සංගීතය

**පාඩම** - 7.2 ආදේශ භාණ්ඩ ආශ්‍රිත නිර්මාණයේ යෙදෙයි. (වැස්ස)

**අරමුණු** -
01. ස්වර හතක් දක්වා වීදුරු භාණ්ඩ වර්ධනය කරයි
02. ලියන ලද ස්වර ප්‍රස්තාර කියවා බලා වාදනය කරයි
03. නිර්මාණය කර ඇති වාද්‍ය භාණ්ඩ හා මාතෘකාව අතර ගැලපීම විමසයි
04. නව සංගීත බණ්ඩ නිර්මාණය කිරීමට පෙළඹෙයි
05. සමූහය සමග වයමින් රස විඳියි

**පෙර ඉගෙනුම්**

- විවිධ ස්ථාන වලින් ගලායන ජලයෙන් නිකුත්වන හඬ දෙස ඉතා අවධානයෙන් ඇසීමට යොමුකරවීම.
- එසේ නිදහසේ ගලා යන ජලයේ කිසියම් රිද්මයක්, සංගීතයක් ගැබ්වී ඇතිබව දරුවාටම පසක් වීමට ඉඩ හැරීම
- නිසිලෙස ප්‍රමාණාත්මකව වීදුරු කිහිපයකට ජලය පුරවා කිසියම් නාදයක් නිපදවීමට යොමුකරවීම.
- එක සමාන නොවූ වීදුරු බෝතල් හතරක් ගෙන එක සමාන ජලය ප්‍රමාණයක් එම බෝතල් දෙකක් තුලට දමා ඉතිරි බෝතල් දෙක වතුර නොදමා කුඩා ගල් කැටයකින් තට්ටුකිරීමට සලස්වා වෙනස වටහා ගැනීමට සැලැස්වීම.
- පැපොල් බටයකින් නලාවක් සාදා පැපොල් බටයේ මැදට ජලය ස්වල්පයක් දමා වාදනය කර එමගින් දරුවාට නැවුම් අද්දැකීමක් ලබාදීමට හැකිවීම.

**පන්ති කාමර ඉගෙනුම**

**වැස්සක් නිර්මාණය කිරීම (දරුවන් කණ්ඩායම් තුනකට බෙදීම)**

පළමු කණ්ඩායම - එක සමාන නොවූ බොතල් කිහිපයක් ගෙන ඉන් කිහිපයකට ජලය නොයොදා අනික් බෝතල් කිහිපයට ජලය විවිධ ප්‍රමාණයට පුරවා ගල් කැටයකින් තට්ටුකිරීමට සැලැස්වීම

(ජලය නොමැතිවිට සහ ජලය ඇති විට හඬෙහි ඇති වෙනස වටහා ගනී)

දෙවැනි කණ්ඩායම - ස්වර හතට සමාන ලෙස වීදුරු භාජන වලට ජලය පුරවා සකසා ගෙන ලී කෝටු දෙකකින් වාදනයට සැලැස්වීම

(ජලය යොදා සංගීත මෙවලමක් නිපදවිය හැකි බව සහ තව තවත් එය දියුනු කළ හැකි බව)

තුන්වැනි කණ්ඩායම- හිස් බෝතල් කට තියා පිඹීම මගින් ද ජලය පිරවූ වීදුරු කිරිපයක් (වැස්සේ ශබ්ධය ගැනීම සඳහා යොදාගැනීමට) යොදාගෙන වැස්සක් නිර්මාණාත්මකව ඉදිරිපත්කළ හැකිය.

(ජලය උපයෝගීකොටගෙන නව සංගීත භාණ්ඩ නිපදවීමට උත්සුක වෙයි)

**පසු ඉගෙනුම්**

- ✓ දයාබර දුවේ පුතේ youtube යෙදුමේ Evoke Kids Zone කියන නාලිකාවේ To make a jal tarang කියලා සෙව්වොත් ඔයාලට පුලුවන් ජලතරංගයක් හදන හැටි ඉගෙන ගන්න
- ✓ ඒ වගේම youtube යෙදුමේ Science - Xpress කියන නාලිකාවේ තියනවා How to make a Jaltharan කියලා සොයා බලන්න.
- ✓ ජලය යොදා නිර්මාණය කල හැකි වෙනත් සංගීත භාණ්ඩයක් සෑදීමට උත්සාහ කරන්න.